ජගත් ජේ එදිරිසිංහ

# කාම

## 11

කුමාර සුරවීර තමා හමුවන්නට නැවත එනු ඇතැයි නිරාශා කිසිවිටෙක අපේක්ෂා නොකළා ය. අවසන් වතාවට ඔහු හමුවූ දිනයේ ඔහුගේ සිනමාපටයේ රඟපෑම සඳහා ඔහු කළ ආරාධනාව තමා එකහෙළා ප්‍රතික්ෂෙප කිරීමෙන් පසු ඔහු පිටව ගියේ නොපහන් හැඟීමකින් යුක්තව  බව නිරාශා දැන සිටියා ය.

"ඒ මනුස්සය ආයෙ මගේ මූණවත් බලන එකක් නැහැ.." එදින ඈ විදුලට කීවා ය.

"කුමාර ඒ හැටි මෝඩයෙක් නෙවෙයිනෙ.. " එදා විදුල කී බස සැබෑ කරමින් ඔහු නැවත පැමිණ සිටියි. ඒ පැමිණීම නිරාශාගේ සිතේ ඇති කළේ සතුටකි. සිනමා ක්ෂෙත්‍රයේ තමාගේ ආකර්ශනීය ප්‍රතිරූපය තවමත් වියැකී නැති බවට තවත් සාක්ෂියක් අවශ්‍ය නැත.




"මං ෆිල්ම් එකට සරල ව ගත්තෙ හිතට එකඟව නෙවෙයි නිරාශා.." නිරාශා අතින් තේ කෝප්පය ගනිමින් කුමාර කීවේ ය.  "..ඒ ස්ක්‍රිප්ට් එක කියෙව් වෙලාවෙ ඉඳන් මගේ හිතේ ඇඳුනෙ ඔයා.. ඔයා ආයෙමත් ඇක්ටිං වලට එනවා කියන නිව්ස් එකෙන් වඩාම සතුටු වුණේ මං.. ඒකයි මං ආයෙම පාරක් ඔයාට ආරාධනා කරන්න හිතුවෙ.."

නිරාශා කිසිවක් නොකියා අසා සිටියා ය. එකවරම ඔහුට පිළිතුරක් දීම අපහසු යයි ඇයට සිතුණි.

"පත්තරේ ඔයාගෙ ඉන්ටර්විව් එක කියෙව්ව.. මට හිතුණ ඔයා දැන් අදහස් වෙනස් කරගෙන කියලා.. ඒක හොඳයි.. ඔයා වගේ කෙනෙක් පැත්තකට වෙලා ඉන්නවා කියන්නෙ ඉන්ඩස්ට්‍රි එකටම පාඩුවක්.." කුමාර කියන්නේ අවංකව විය යුතු යයි නිරාශා සිතුවා ය.  ඔහු වැනි ප්‍රවීණයකු චාටු බස් නොකියනු ඇත.

"මන්දා.." නිරාශා කීවා ය. "..හොඳයි කියලා පෙනෙන රෝල් එකක ලැබුණොත් කරනවා කියලයි මං හිතුවෙ.. ගොඩක් බදාගෙන කරන්න මං ආස නැහැ.."

"මං දන්නවා මේ කැරැක්ටර් එකට නිරාශා කැමති වෙන බව.. මට හන්ඩ්‍රඩ් පසන්ට් ෂුවර් මේක ඔයාට එවෝඩ් එකක් ගන්න පුලුවන් විදියෙ රෝල් එකක් කියලා.." කුමාර කියන්නේ දැඩි විශ්වාසයකිනි. ".. මං ස්ක්‍රිප්ට් එක තියලා යන්නම්.. නිරාශා කියවලා මට කෝල් එකක් දෙන්න.. ඔයා වෙනුවෙන් තව දවස් කීපයක් බලා ඉන්න මට පුලුවන්.."

0000000000

විදුල අවදි වූයේ එළාමයේ කන කීරි ගස්සන අඳෝනාවටය. වෙනදාට කුස්සියෙන් ඇසන තේ සාදන හඬ අද නෑසෙයි. නිරාශා කල් ඇතිවම නිවසින් පිටව යන්නට ඇත.

කුමාරගේ සිනමාපටයේ රූ ගැන්වීම් ඇරඹුනේ ඊයේ ය. සතියක් කොළඹ රූ ගැන්වීම් වලට පසුව සති තුනක කාලයක් සඳහා ඔවුන් බණ්ඩාරවෙලට යන බව නිරාශා කී බව විදුලට මතක ය.

ඊයේ සවස නිරාශා ගෙනැවිත් තම ලියන මේසය මත තැබූ රුපියල් ලක්ෂ පහක් සටහන්ව ඇති චෙක් පත තවමත් එතැන ම ඇති ආකාරය ඔහුට පෙනෙයි.

"මේ සල්ලි ඔයාගෙ ෆිල්ම් එකේ වැඩ වලට ගන්න.." චෙක් පත විදුල දෙසට දික්කරමින් නිරාශා කීවාය. නිමේෂයකට චෙක් පත දෙස බැලූ ඔහු ඉවත බලා ගත්තේ ය.

"ගන්න.." ඈ නැවත කීවා ය.

කෝපයත් වේදනාවත් සම්මිශ්‍රිත තේරුම් ගත නොහැකි විකල් හැඟීමකින් ඔහුගේ සිත පිරී ගියේ ය. වදනක් හෝ දොඩා ඒ ආවේගය මුදා හැර නිරාශා ගේ සිත පෙළන්නට ඔහු නොසිතුවේ ය. නිහඬව ඈත බලා සිටියේ ඒ නිසා ය.

විවාහයෙන් පසු පළමු වතාවට නිරාශා තනි තීරණයක් ගෙන ඇත.  මේ කැළඹීම ඇගේ ඒ පියවර යටි සිත අනුමත නොකරන නිසාවෙන් විය හැකිදැයි සිතන්නට විදුල උත්සාහ ගත්තේ ය. එසේත් නැත්නම් ඇය වෙනකකුගේ නිර්මාණයකට දායක වීම නිසා හටගත් ඊර්ෂ්‍යාවක් නිසා විය හැකිද? එසේත් නොවේ නම් නිරාශා තමා කිසිදු ලෙසකින් අනුමත නොකරන දේශපාලන ක්‍රියාදාමයක අනියම් හවුල්කාරියක බවට පත්ව ඇති නිසා ද?

නිරාශා චෙක් පත ඔහු ඉදිරියේ මේසය මත තැබුවා ය.

"මේක ඇඩ්වාන්ස් එකක්.. ඉතිරි කොටස ෂූටිං ඉවර වුණ ගමන් ලැබෙයි.. අලුත් ප්‍රොඩියුසර් කෙනෙක්.. හසන්ත ඇලදෙණිය කියලා.. කම්පැනීස් ගණනාවක අයිතිකාරයෙක්ලු.. ගනුදෙනු වලට හොර නැති මනුස්සයෙක් වගෙයි පේන්නෙ.." නිරාශා කීවාය. ".. මං හිතන්නෙ හැමෝටම ඇඩ්වාන්ස් එක අදම ගෙව්වා.."

ඒ පිළිබඳව පුදුම විය යුතු නැත. කුමාර වෙනුවෙන් සැදී පැහැදුන නිෂ්පාදකයන් බොහෝ සිටින බව විදුල දනියි. කුමාර ලාංකේය සම්මත ඉතිහාසය පවා විකෘති කරමින් නිපදවන බ්ලොක්බස්ටර් සිනමා පට සඳහා අතදිගහැර වියදම් කරන්නට නිෂ්පාදකවරු පෙළ ගැසී සිටියදී තමන්ගේ සමාජ මෙහෙවර සඳහා වියදම් කරන්නට එකදු නිෂ-
"පාදකවරයකු හෝ නොමැති වීම අදහාගත නොහැකි දෙයකැයි විදුලට සිතුණි. ඒ සිතුවිල්ල ඔහුගේ සිතේ ජනිත කළේ දැඩි ආත්මානුකම්පාවකි.

මේ සියල්ල පසුපසින් ඇති දේශපාලනය හඳුනාගන්නට ඔහුට හැකි ය. මිනිසුන් සත්‍යයෙන් ඈත්කර මායා ලෝකවල සිර කළ යුතු බව පාලකයෝ දනිති. එවන් මායා ලෝක බිහිකිරීම සඳහා අනලස්ව දායක වන කුමාර වැනි අධ්‍යක්ෂකවරුන්ට මුදල් වියදම් කරන්නට නිෂ්පාදකවරුන් බිහිකරන්නට පාලකයෝ සමත්හුය. මේවා අහඹු සිදුවීම් නොවේ. මෙය මනාව සැළසුම් කරන ලද දේශපාලන ක්‍රියාවලියකි. ප්‍රශ්නය මේ ක්‍රියාදාමය පිළිබඳ හාංකාවිසියක් හෝ නොදන්නා සේ අනෙක් සියල්ලන්ම අන්ධයන් බිහිරන් ගොලුවන් සේ ජීවත් වීමය. දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ මේ මායාව පවත්වාගෙන යන්නට දායක වීමය. නිරාශා මේ කරන්නේද මේ පාදඩ ක්‍රමයටම අනියමින් දායකවීමක් නොවේදැයි සිතෙන විට විදුලගේ සිතට දැනෙන වේදනාව අපමණ ය.